ආබාධ සහිත වූවන් හැඳින්වීමේදී පුද්ගල-ප්‍රථම භාෂාවක් භාවිත කිරීම ප්‍රශංසනීයයි!

පොදුවේ යම් කිසි තාවකාලික හෝ දීර්ඝකාලීන හෝ ස්ථිර ආබාධයක්/ආබාධයන් සහිතව ජීවත් වන සැමදෙනෙකුටම සමාජය තුළ ගර්හාවකට හෝ කොන් කිරීමකට ලක් නොවී ජීවත් වීමේ ප්‍රවේශයක් ඇති කිරීම සමාජ අවශ්‍යතාවයක් නොවේද, එහිදී ඔවුන්ව හඳුන්වන භාෂාවද වැදගත් තැනක් නොගන්නේද යන පැනයන්, Ethics Eye අපි බොහෝ විට මාධ්‍ය වෙතින් මෙන්ම පාඨක ඔබෙන්ද අසමු.

ආබාධ සහිතව ජීවත් වන අය හඳුන්වන භාෂාව සම්බන්ධයෙන් ගත් විට, ඒ සඳහා පුද්ගල-ප්‍රථම භාෂාවක් (person-first language), නැතිනම් අනන්‍යතාවය-ප්‍රථම භාෂාවක් (identity-first language) භාවිත කිරීම වඩාත් යෝග්‍ය නොවන්නේදැයි විමසා බැලිය හැක.

Person-first language නැතිනම් 'පුද්ගලයා පළමු වන භාෂාව' යන්නෙහි අදහස වන්නේ ඒ ඔස්සේ ආබාධ සහිත වූවන් හැඳින්වීමේදී, පුද්ගලයා පළමුව පැමිණෙන බවත්, ඔහුගේ ආබාධ දෙවන තැන ගන්නා බවත් වේ.

"කෘත්‍රිම පාද සුදු සැරයටි බද්ද ඉවතට" යන මැයෙන් යුතුව පුවතක් ඉදිරිපත් කරන අරුණ (අගෝස්තු 21, 2023) විසින්, පුවත් අන්තර්ගතයේ "ආබාධ සහිත තැනැත්තන්" යනුවෙන් පුද්ගල-ප්‍රථම භාෂාවක් යොදාගනිමින් අදාළ හැඳින්වීම සිදුකරයි.

මෙය සැබවින්ම ප්‍රශංසා කටයුතු ප්‍රවණතාවයක් බව අපි මෙසේම පවසමු.

මූලාශ්‍ර:
https://ncdj.org/style-guide/
https://pwd.org.au/.../2019/08/PWDA_LanguageGuide_A5_WEB.pdf
https://adata.org/factsheet/ADANN-writing